සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,724 - 2011 සැප්තැම්බර් මස 16 වැනි සිකුරාදා - 2011.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1556 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1558 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1562 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 සැප්තැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ III වැනි පන්තියේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 01. | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| | මාර්ග කම්කරු | 03 | අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් 02ක් සමත්වීම |
| | මුරකරු | 01 | අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් 02ක් සමත්වීම |

02. *වැටුප් පරිමාණය :* රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) පී. එල් 1 - 2006 ඒ).

*03. පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ).
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්දහිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතුය).
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(vi) දැනටමත් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන් /අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

*05. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නියමිත පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍ර 2011 ඔක්තෝබර් මස 25 දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ආරච්චිකට්ටුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය :-

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතිකය,
03. හැඳුනුම්පතේ පිටපතක්,
04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එක් චරිත සහතියක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතුය.),
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික.

ඩබ්. ඩබ්. රංජිත් තමෙල්,
ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 01 දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ III වැනි පන්තියේ ............................................ තනතුර සඳහා බඳවා ගැනීම**

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම : ——————.
    (ii) මුලකුරු සමග නම: ——————.

02. ස්ථිර ලිපිනය: ——————.
03. ග්‍රාම නිලධාරී වසම හා අංකය: ——————.
04. උපන් දිනය ؛ අවුරුද්ද: ——————, මාසය: ——————, දිනය: ——————.
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ؛ අවුරුදු: ——————, මාස: ——————, දින: ——————.
06 ස්ත්‍රී/පුරුෂභාවය: ——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය: ——————.
08. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර: ——————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග : ——————.
10. අධ්‍යාපන සුදුසුකම් : ——————.
11. වෙනත් සුදුසුකම්: ——————.
12. වෘත්තීය සුදුසුකම්: ——————.
13. සේවා පළපුරුද්ද: ——————.

    (i) දැනට සේවය කරන ආයතනය: ——————.
    (ii) දැනට දරන තනතුර: ——————.
    (iii) එම තනතුරට පත් වූ දිනය: ——————.
    (iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර: ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ؛*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම: ——————.
පදවි නාමය: ——————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව තබන්න) : ——————.
දිනය : ——————.

09-530

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහ නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2011.08.09 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

ගාමිණී මහින්දපාල ජොපියස්,
බලයලත් නිලධාරි - බදුල්ල.

2011 අගෝස්තු මස 26 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

### *උපලේඛනය*

| *අනු අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම්පස වරිපනම් අංකය* | *දකුණුපස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 01 | බදුලුපිටිය කාදර් මාවත පළමු පටුමග | කාදර් මාවත බදුලු පිටිය | 9/4 | 9/3 | 9/9,9/8,9/7,9/6 9/5,9/4 | 100 | 3.05 |

09-418

---

## බදුල්ල මහ නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2011.07.04 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
බලයලත් නිලධාරි - බදුල්ල.

2011 අගෝස්තු මස 26 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම්පස වරිපනම් අංක | දකුණුපස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | රේස්කෝස් පාර 1 පටුමග | රේස්කෝස් පාර | 96/3 | 90/02,90/02/1/ 01, 90/03,90/02/01, 90/01ඒ, 96/03, 90/01 | - | 100 | 3.5 |

09-419

---

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2011.03.07 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

ගාමිණී මහින්දපාල ජොපියස්,
බලයලත් නිලධාරි - බදුල්ල.

2011 අගෝස්තු මස 26 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම්පස වරිපනම් අංක | දකුණුපස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | ළිදමුල්ල වීර්යපුර පටුමග | ස්ප්‍රිංවැලි පාර | 19/28 | 169/1,123/5,19/28 | 169/17,169/5 19/19,19/18 | 144 | ආරම්භක අඩි 09 අවසානය අඩි 11 |

09-420

---

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2011.07.04 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාළ මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
බලයලත් නිලධාරි - බදුල්ල.

2011 අගෝස්තු මස 26 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම්පස වරිපනම් අංක | දකුණුපස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | දෙයියන්නේවෙල ලියන්ගොල්ල පාර | දෙයියන්නේවෙල පාර | 220/06 | 224,224/1,226 | 220/5,220/6 | 3 | 3.40 |

09-421

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2012 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇති ප්‍රදේශ වලින් 2012 වර්ෂය සඳහා දේපලවල වාර්ෂික වටිනාකමින් 2.50% වරිපනම් බද්දක් අයකිරීමටත්, එම වරිපනම් බදු 2012 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනට සමාන වාරික 04කින් අයකිරීමටත්, 2011 ජනවාරි 31 දිනට ප්‍රථම මුළු මුදල ගෙවන්නේ නම් 10% වට්ටමක් ද කාර්තුවට අදාළ මුදල, මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ද ගෙවීමට 2011.08.17 දින රැස්වූ කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ යෝජනා අංක 08-x යටතේ සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. තව ද හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වර්පනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට පහලොවක (15%) අධිගාස්තුවක් සහ;
2. හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපල සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට විස්සක් (20%) අධිගාස්තුවක් අය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 22 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-378/5

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තිය ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල පිහිටියා වූ,, වගාකළ ඉඩම් වලින් ඇමතිතුමාගේ අනුමැතිය ප්‍රකාර හෙක්ටයාර 1 සිට 5 දක්වා රු. 50ක අක්කර බද්දක් පනවා ඊට වැඩිවන සෑම හෙක්ටයාරයකටම රු. 10ක අක්කර බද්දක් පනවා 2012 මාර්තු 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු අවසන් වීමට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද මෙම පනතේ 134(7) වගන්තිය ප්‍රකාර පහත පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට පහත සඳහන් වට්ටම් මුදල් ප්‍රදානය කරනු ලබන බව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2011 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 08-IX යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) 2012 ජනවාරි 31 දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම අදාළ අක්කර බදු මුදල ගෙවුවහොත් එම මුදලින් 10%ක්,
(ආ) අක්කර බද්ද කාර්තු වශයෙන් ගෙවන විට කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලැබුවහොත් එම මුදලින් 5%ක්.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 22 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-378/4

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(I) වැනි වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු, නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලැබෙන මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරුවෙකු හෝ සේවකයෙකු හෝ වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ අන් නියෝජිතයෙකු විසින් කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2011 අගෝස්තු මස 17 දින පැවති මහ සභාවේ යෝජනා අංක 08XIII යටතේ යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 22 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-378/8

**නාඋල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(3) වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතලප්‍රකාර බලය ලැබෙන්නා වූ ද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ද අනුව ඔහු විසින් සම්පාදනයකර, අංක 520/7 හා 1988.08.23 දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 607 හා 1990.04.20 දින දරන ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් පිළිගනු ලැබුවා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථා 1 සිට 42 දක්වා කාණ්ඩ මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට වලංගු වන සේ පිළිගැනීමට නාඋල ප්‍රාදේශීය සභාවේ 2011.06.30 වැනි දින පැවැත්වූ සභා රැස්වීමේ දී සම්මත වූ යෝජනාවක් ලෙස තීරණ අංක 5.8 මගින් තීරණය වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 26 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-381

---

**කෑගල්ල නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2012 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධතාවට හේතුව ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන මෙන් මෙයින් දන්වා සිටිනු ලැබේ.

පී. කේ. සමරසිංහ,
සභාපති,
කෑගල්ල නගර සභාව.

2011 අගෝස්තු මස 30 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| මෛත්‍රී අතුරුපාන, 343/7, රංවල, කෑගල්ල. | ලේකම් | කෑගල්ල වැව්ලිකරුවන්ගේ ක්‍රීඩා සමාජය | අංක 39, ස්වර්ණ ජයන්ති මාවත, කෑගල්ල. |

09-583

# විවිධ දැන්වීම්

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද - 2012**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2012 වර්ෂය සඳහා අයකිරීමටත් එය 2011 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු බවටත්, 2011.08.17 දින රැස්වූ මහ සභාවේ යෝජනා අංක 8 X 11 යටතේ සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 22 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා, සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -

| | | |
|---|---|---|
| (අ) | වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) | වෙළඳ කාර්යයන් නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් සෑම කරත්තයක් සඳහා | 4 0 |
| (ඇ) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (ඈ) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (ඉ) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (ඊ) | සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (උ) | සෑම ඇතෙකු සඳහාම | 50 0 |

09-378/7

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ ඇතැම් වෙළඳ ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් බදු පැනවීම :

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෙර වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පහත උපලේඛනයේ දැක්වෙන අනුප්‍රමාන නොඉක්මවන බද්දක් අයකිරීම 2011.08.17 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 08VIII යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තු 2012 මාර්තු 31 දිනට ප්‍රථම ගෙවා ව්‍යාපාර හා වෘත්තීය සඳහා බලපත්‍ර ගාස්තු ලබාගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| I තීරය | II තීරය |
|---|---|
| 01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 02. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 |
| 03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 |
| 04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 |
| 05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 |
| 06. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 |

*වෘත්තීය හා ව්‍යාපාර බදු මුදල් අයකිරීම සඳහා ව්‍යාපාර :*

01. කොමිස් ඒජන්තවරුන්
02. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් ලෙස ක්‍රියාකිරීම
03. බඩු උකස් ගන්නෙකු ලෙස ක්‍රියාකිරීම
04. කොන්ත්‍රාත්කරුවකු ලෙස ක්‍රියාකිරීම
05. ගණන් පරීක්ෂකවරයෙකු ලෙස ක්‍රියා කිරීම
06. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස ක්‍රියා කිරීම
07. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීම
08. මුදල් ණයට දෙන්නෙකු ලෙස ක්‍රියා කිරීම
09. ප්‍රධාන සේවා අයිතිකරුවකු හෝ ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකිරීම
10. ආදායම් බදු හෝ කම්කරු නීති උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම
11. මිනින්දෝරු කාර්යාලයක් පවත්වාගෙන යාම

12. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
13. නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
14. බටහිර වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
15. දේශීය වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
16. දන්ත වෛද්‍ය ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
17. ලොතරැයි ඒජන්තවරයෙකු ලෙස ක්‍රියා කිරීම
18. රේස් ඔට්ටු භාරගන්නා තැනැත්තවුන් ලෙස ක්‍රියා කිරීම
19. වානිජ බැංකු, ග්‍රාමීය බැංකු පවත්වාගෙන යාම
20. විදේශීය රැකියා ඒජන්තවරයෙකු ලෙස ක්‍රියාකිරීම
21. භාණ්ඩ ආනයනකරුවකු ලෙස ක්‍රියා කිරීම
22. භාණ්ඩ අපනයනකරුවෙකු ලෙස ක්‍රියා කිරීම
23. පුද්ගලික ආරෝග්‍යශාලා පැවැත්වීම
24. පුද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීම
25. විදුලි සංදේශ කුළුණු

09-378/3

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම

2012 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තු 2012 වසර සඳහා පනවා අයකිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2011 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 8-VI යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තු 2012 මාර්තු 31 දිනට ප්‍රථම ගෙවා අදාළ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *අන්තරාදායක වෙළඳාම* | *වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි නොවන ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට අඩු ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි ස්ථාන* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 02. කඩල බයිට්ස් වර්ග නිෂ්පාදනය | | | |
| 03. අයිස් පැකට් කිරීම හා අලෙවිය | | | |
| 04. අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 05. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | | | |
| 06. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිපදවීම | | | |
| 07. තෙල් මෝලක් පවත්වාගෙන යාම | | | |
| 08. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම (කොහු මෝල්) | | | |
| 09. කොහු හෝ වෙනත් කෙඳි වලින් භාණ්ඩ නිෂ්පාදනය | | | |
| 10. ලුණු ඇඹරීම | | | |
| 11. ලී මෝලක් පවත්වාගෙන යාම | | | |
| 12. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ලී මෝලක් පවත්වාගෙන යාම | | | |
| 13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියාව | | | |
| 14. කම්හලක් පවත්වාගෙන යාම | උපරිමය | උපරිමය | උපරිමය |
| 15. හිස් ගෝනි හෝ බෝතල් ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 500-750 0 | 750 - 1,000 |
| 16. පාපැදි අළුත්වැඩියා කිරීම | | | |
| 17. රතිඤ්ඤා ගබඩා කිරීම | | | |
| 18. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් සඳහා | | | |
| 19. අතින් ක්‍රියාත්මක කරන මුද්‍රණාලයක් සඳහා | | | |
| 20. යන්ත්‍රානුසාරයෙන් උළු නිපදවීම | | | |
| 21. භූමිතෙල් කරත්තයක් සඳහා | | | |
| 22. භූමිතෙල් බැරල් 05-10 දක්වා | | | |
| 23. භූමිතෙල් බැරල් 10ට වැඩි | | | |
| 24. ආමේචර් එතීම (මෝටර් එතීම) | | | |
| 25. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | | | |
| 26. බැටරි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 27. රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියාව | | | |

| | *අන්තරාදායක වෙළඳාම* | *වර්ෂික වටිනාකම රු. 750ට වැඩි නොවන ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට අඩු ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 1500ට වැඩි ස්ථාන* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 28. | විදුලි උපකරණ අළුත්වැඩියාව | | | |
| 29. | ගෑස් පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 30. | ගෑස් සිලින්ඩර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 31. | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | | | |
| 32. | දේශීය බෙහෙත් ශාලවක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | | | |
| 33. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | | | |
| 34. | දේශීය බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | | | |
| 35. | දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 36. | බලවේග පේෂ කර්මාන්තයක් පවිතාවගෙන යාම | | | |
| 37. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය හා ගබඩා කිරීම | | | |
| 38. | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 39. | පොත් සාප්පු ලිපිද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය | | | |
| 40. | මිශ්‍ර පොහොර අලෙවි කිරීම (කෘත්‍රිම) | | | |
| 41. | කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ කෘෂි උපකරණ විකිණීම | | | |
| 42. | පොල්කටු අඟුරු නිපදවීම | | | |
| 43. | කටු වලක් පවත්වාගෙන යාම | | | |
| 44. | සිගරට්, දුම්කොළ තොග වශයෙන් පවත්වාගෙන යාම | | | |
| 45. | සබන් නිපදවීම | | | |
| 46. | පරණ ලෝහ භාණ්ඩ ගබඩා කිරීම | | | |
| 47. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | | | |
| 48. | පොල් ලී නිෂ්පාදනය කිරීම හා විකිණීම | | | |
| 49. | සිසිල්බීම නිපදවීම හා ගබඩා කිරීම | | | |
| 50. | රසකැවිලි නිපදවීම | | | |
| 51. | කොහු ගබඩා කිරීම | | | |
| 52. | කොහු කෙඳි පීරීම හා වේලීම | උපරිමය 500 0 | උපරිමය 500-750 0 | උපරිමය 750 - 1,000 |
| 53. | කොහු භාණ්ඩ නිෂ්පාදනය | | | |
| 54. | කෙඳි සායම් කිරීම | | | |
| 55. | තීන්ත හෝ වාර්නිෂ් කිරීම | | | |
| 56. | මිරිස් ධාන්‍ය හා කෝපි වැනි කුළුබඩු ඇඹරීම | | | |
| 57. | ටයර් හා ටියුබ් වෝල්කනයිසිං කිරීම | | | |
| 58. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | | | |
| 59. | යන්ත්‍රානුසාරයෙන් ටයර් අළුත්වැඩියා කිරීම | | | |
| 60. | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප හෝ එවැනි භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම | | | |
| 61. | ෆයිබර් ග්ලාස් භාණ්ඩ නිපදවීම | | | |
| 62. | සිමෙන්ති බ්ලොක්ගල් වැඩපලක් පවත්වාගෙන යාම | | | |
| 63. | ගඩොල් නිපදවීම හා පිළිස්සීම | | | |
| 64. | බේකරියක් පවිතවාගෙන යාම | | | |
| 65. | පපඩම් නිපදවීම | | | |
| 66. | කජු ගබඩා කිරීම හෝ මද නිපදවීම | | | |
| 67. | කිරි අලෙවි සැලක් පවත්වාගෙන යාම | | | |
| 68. | කොප්පරා නිපදවීම හා විකිණීම | | | |
| 69. | කපාපු පොල් නිපදවීමේ ස්ථානයක් පවත්වනෙ යාම | | | |
| 70. | හුණුගල් පිළිස්සීම | | | |
| 71. | බොරළු කපන ස්ථානයක් පවත්වාගනෙ යාම | | | |
| 72. | මැටි වලක් පවත්වාගෙන යාම | | | |
| 73. | උත්සව සඳහා ආහාරපාන සැපයීම | | | |
| 74. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | | | |
| 75. | පොල්ගෙඩි රැස්කිරීම හා විකිණීම | | | |
| 76. | සිසිල්බීම හලක් පවත්වාගෙන යාම | | | |
| 77. | සිංහල බෙහෙත් ද්‍රව්‍ය අලෙවිය | | | |
| 78. | ඇඳුම් නිෂ්පාදනය | | | |
| 79. | බතික් නිෂ්පාදනය | | | |
| 80. | ඇඟළුම් නිෂ්පාදනය | | | |
| 81. | මීනීපෙට්ටි නිෂ්පාදනය හා විකිණීම | | | |
| 82. | ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාවගෙන යාම | | | |

| *අන්තරාදායක වෙළඳාම* | *වර්ෂික වටිනාකම රු. 750ට වැඩි නොවන ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට අඩු ස්ථාන* | *වාර්ෂික වටිනාකම රු. 1500ට වැඩි ස්ථාන* |
|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| *අප්‍රසන්න ව්‍යාපාර :-* | | | |
| 01. සම් පදම් කිරීම හෝ සම් ගබඩා කිරීම | | | |
| 02. සම්භාණ්ඩ නිපදවීම | | | |
| 03. කිරිපට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | | | |
| 04. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 25-50 දක්වා) | | | |
| 05. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 50ට වැඩි) | | | |
| 06. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන්, කිකිළියන් 100) | | | |
| 07. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන්, කිකිළියන් 100ට වැඩි) | | | |
| 08. කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන්, කිකිළියන් 200ට වැඩි) | | | |
| 09. එළු පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| 10. ගව පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | | | |
| 11. ගව පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| 12. ග්‍රොසරියක් පවත්වාගෙන යාම | උපරිමය | උපරිමය | උපරිමය |
| 13. කරවල ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 500-750 0 | 750 - 1,000 |
| 14. කරවල කඩයක් සඳහා | | | |
| 15. කුකුළු කෑම ගබඩා කිරීම හා විකිණීම | | | |
| 16. සත්ව ආහාර ගබඩාවක් පත්වාගෙන යාම | | | |
| 17. රා එකතු කිරීමේ ස්ථානයක් පව්තවාගෙන යාම | | | |
| 18. විනාකිරි නිපදවීම | | | |
| 19. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 20. එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 21. අළුත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 22. ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | | | |
| 23. ශීතකළ මස්, මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 24. බිත්තර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 25. පුද්ගලික මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | | | |
| 26. සංචාරක මාළු අලෙවිය | | | |
| 27. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| *අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම* | | | |
| 01. ලොන්ඩරියක් පවත්වාගෙන යාම | | | |
| 02. රතිඤ්ඤා නිපදවීම | | | |
| 03. බැටරි චාර්ජ් කරන ස්ථානයක් සඳහා | | | |
| 04. වෑල්ඩින්කිරීම හා ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම | | | |
| 05. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | උපරිමය | උපරිමය | උපරිමය |
| 06. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 500-750 0 | 750 - 1,000 |
| 07. බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 08. මෝටර් වාහන බොඩි ගැසීමේ ගරාජයක් පවත්වාගෙන යාම | | | |
| 09. ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | | | |
| 10. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | | | |
| 11. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | | | |
| 12. සිමෙන්ති ගබඩා කිරීම හා ගබඩා කිරීම | | | |
| 13. නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය, කුළුබඩු තොග වශයෙන් පවත්වාගෙන යාම | | | |
| 14. යතුරු පැදි අළුත්වැඩියාව | | | |
| 15. යකඩ භාණ්ඩ නිෂ්පාදනය | | | |

09-378/1

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා 150 වගන්තිය යටතේ ඇතැම් වෙළඳාම් හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පැනවූ ඇතැම් වෙළඳම් සහ කර්මාන්ත සම්බන්ධ බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2011 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 8-VII යටතේ යෝජනා සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 150(1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත සම්බන්ධ බදු**

| | | | | |
|---|---|---|---|---|
| 01. | ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පැවැත්වීම | | | |
| 02. | ගීත පටිගත කරන ස්ථානයක් පැවැත්වීම | | | |
| 03. | රෙදි විකුණන සාප්පුවක් පැවැත්වීම | | | |
| 04. | සාප්පු බඩු විකුණන ස්ථානයක් පැවැත්වීම | | | |
| 05. | කැසට් වර්ග කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම | | | |
| 06. | දුරකථන ඇමතුම් ලබාදෙන ස්ථානයක් පැවැත්වීම | | | |
| 07. | ඡායාස්ථ පිටපත් ගැනීම, රෝනියෝ කිරීම, ටයිප් කිරීම වැනි කටයුතු සඳහා ස්ථානයක් පැවැත්වීම | | | |
| 08. | ප්‍රචාරක දැන්වීම් බෝඩ් ඇඳීම | | | |
| 09. | ශබ්ද වාහිනී යන්ත්‍ර, බල්බ් , වේදිකා කුලියට සැපයීම | | | |
| 10. | උත්සව භාණ්ඩ කුලියට සැපයීම | | | |
| 11. | රියදුරු පුහුණු ආයතනයක් පැවැත්වීම | | | |
| 12. | ළදරු පාසලක් (මුදල් අයකර) පැවැත්වීම | | | |
| 13. | මුදල් අයකර අමතර ඉගැන්වීම් පන්තියක් පැවැත්වීම | උපරිමය | උපරිමය | උපරිමය |
| 14. | දර විකුණන ස්ථානයක් පැවැත්වීම | 500 0 | 500-750 0 | 750 - 1,000 |
| 15. | ඉංග්‍රීසි බෙහෙත් විකුණන ස්ථානයක් (ෆාමසියක්) පැවැත්වීම | | | |
| 16. | සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පැවැත්වීම | | | |
| 17. | බුලත් විකුණන ස්ථානයක් පැවැත්වීම | | | |
| 18. | මෝටර් රථ අමතර කොටස් විකිණීම | | | |
| 19. | තෑගි භාණ්ඩ විකිණීම | | | |
| 20. | මෝටර් බයිසිකල්, පාපැදි අමතර කොටස් විකිණීම | | | |
| 21. | විසිතුරු මල් වර්ග පැළැටි වර්ග විකිණීම | | | |
| 22. | පින්තූර රාමු කිරීම | | | |
| 23. | ඇඳුම් මැසීම | | | |
| 24. | පුවත්පත්, සඟරා විකිණීම | | | |
| 25. | කුෂන් වැඩපලක් පැවැත්වීම | | | |
| 26. | ග්‍රොසරියක් පැවැත්වීම | | | |
| 27. | ප්‍රවාහන කටයුතු සඳහා ඒජන්සියක් පැවැත්වීම | | | |
| 28. | විදුලිය නිපදවන ස්ථානයක් පැවැත්වීම | | | |
| 29. | අන්තර්ජාල පහසුකම් සැපයිම | | | |
| 30. | පොත්පත් විකුණන ස්ථානයක් | | | |
| 31. | නාමපුවරු සකස් කිරීම | | | |
| 32. | පාවහන් විකිණීම | | | |

09-378/2

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා විනෝද බද්ද

විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ පළවෙනි උපවගන්තිය අනුව 2012 අගෝස්තු මස සිට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුදල් අයකර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට දර්ශන, සර්කස් දර්ශන, මැජික් දර්ශන, වීඩියෝපට දර්ශන, සංගීත දර්ශන, කරාතේ, ජූඩෝ ආදී වෙනත් ඕනෑම දර්ශනයක් වෙනුවෙන් එම දර්ශනය සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් සියයට විස්සක (20%) විනෝද බද්දක් පනවා අයකිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2012.08.17 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08-XI යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | රු. ශත |
|---|---|
| (1) ලිත් වර්ෂයකට | 3,500 0 |
| (2) මාස හයකට | 2,500 0 |
| (3) මාස තුනකට | 1,500 0 |
| (4) එක් මාසයකට | 750 0 |
| (5) එක් දිනකට | 100 0 |

වැඩි වන්නාවූ සෑම දිනකටම රු. 200 ක් අය කෙරේ.

සම්පත් සුසන්ත කැටවලගෙදර,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 22 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-378/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.